වාර්ෂික වාර්තාව

2020

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

අන්තර්ගතය

මග පෙන්වන මූලධර්ම 01

- දැක්ම
- මෙහෙවර

ආයතනික අරමුණු හා හර වටිනාකම් 02

ආයතන පනත හා ලියාපදිංචිය 03

ආයතන කළමනාකාරීත්වය 04

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය 05

සභාපතිගේ පණිවිඩය 06

අධ්‍යක්ෂකගේ පණිවිඩය 07

ආයතන ව්‍යුහය 08

මානව සම්පත 09

සංවර්ධන ක්‍රියාකාරකම් හා සේවා සැපයීම 10 - 40

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසන් ගිණුම් 41 - 74

2020 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව 75 - 82

ඇමුණුම 01

මග පෙන්වන මූලධර්ම

දැක්ම :-

නිර්මාණ සංවර්ධනය හා
නව නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම තුළින්
හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය
වඩාත් සක්‍රීය ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම

මෙහෙවර

ප්‍රවර්ධනය, සංවර්ධනය,
හැකියාවන් ගොඩනැංවීම,
ප්‍රචලිත කිරීම සහ
ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුළින්
වෙළඳපොළ පාදක කරගත්
නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම

ආයතනික අරමුණු

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපළ නැමියාවන්ට අනුව නව නිර්මාණ හඳුන්වා දීම.

- සුදුසු තාක්ෂණය හඳුන්වාදීම සහ තත්ත්ව ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණික ආයතන සමඟ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ගුණාත්මක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නිසි තාක්ෂණික හා අමුද්‍රව්‍ය සැකසීමේ ක්‍රම හඳුන්වාදීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට, කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට සහ මහජනතාවට අවශ්‍ය දත්ත පද්ධතියක් පවත්වාගෙන යෑම, නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා සේවාවන් ලබාදීම.

- හස්ත කර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳපොළ වැඩිදියුණු කිරීම.

- රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් හා පුහුණු කිරීම් හරහා මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම.

<u>හර වටිනාකම්</u>

- ❖ අපි වගකීමෙන් බැඳී සිටිමු
- ❖ අවංක හා විනිවිදභාවයෙන් යුතු වෙමු
- ❖ නිපුණත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු
- ❖ නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු
- ❖ හොඳ පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු

ආයතන පනත හා ලියාපදිංචිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශීය හස්ත කර්මාන්තයේ උන්නතිය උදෙසා හස්ත කර්මාන්ත ශිල්පීන් සම්ප්‍රදායෙන් ඔබ්බට ගෙන යමින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය මූලික කරගෙන පිහිටවනු ලැබූ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන අතර, මේ වනවිට බහික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සංවිධානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, සමස්ත හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය අරමුණු ඉටු කරගැනීමට නිරතුරුව ක්‍රියාත්මක වී සිටී. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මෙල් පාර, අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පළාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්ත කර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවී සිටී.

මීට අමතරව, ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර ඒ මඟින් නිර්මාණශීලි හැකියාවන් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව ලබා දී ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුළ ස්ථාපිත පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මඟින් හස්ත කර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක මෙහෙවර තුළින් තම අරමුණු ඉටු කිරීමේදී ප්‍රධාන කර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව බහික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ මහපෙන්වීමත්, පවතින අනෙකුත් සහෝදර ආයතන මෙන්ම පළාත් සභා හා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි නියැලෙන ස්වේච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවන් සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියලුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදී ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අදාල සියලුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරන අතර, පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියලු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මඟින් ද ඉටු කෙරේ.

(i) ප්‍රධාන කාර්යාලය - අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව.

දුරකථන / ෆැක්ස් අංක - 011-2607114 - සභාපති

011-2626345 - අධ්‍යක්ෂ

011-2607814 - පොදු

ෆැක්ස් 011-2607111

ඊ මේල් slndcrisep@yahoo.com / info@slndc.gov.lk

(ii) නත්තරම්පොත ව්‍යාපෘතිය - කලාපුරය, නත්තරම්පොත

කාර්යාලය සහ වැඩහල දුරකථන අංකය / ෆැක්ස් - 081-2420038

අධ්‍යක්ෂ මණ්ඩලය

1)	අජිත් ජයවර්ධන මහතා	- සභාපති
2)	සුදත් අබේසේකර මහතා	- සාමාජික
3)	ප්‍රදීප් ගුණවර්ධන මහතා	- සාමාජික
4)	චන්ද්‍රිකා සේනානායක මිය	- සාමාජික
5)	චිත්‍රාංජලී දිසානායක මිය	- සාමාජික
6)	හෂිනි සිල්වා මිය	- සාමාජික
7)	ආනන්ද ජයසිංහ මයා	- සාමාජික
8)	එස්. එම්. අබේරත්න මහතා	- සාමාජික
9)	කේ. කේ. ඩී. සී. ඉෂාර මහතා	- අමාත්‍යාංශ නියෝජිත

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

1)	අජිත් ජයවර්ධන මහතා	- සභාපති
2)	එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි මහතා	- අධ්‍යක්ෂ
3)	එම්. ඒ. එස්. ගම්ලත් මිය	- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) බස්නාහිර පළාත / අංශ ප්‍රධානි
4)	පී. කේ. විජේසිංහ මහතා	- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) මධ්‍යම පළාත
5)	බී. මනතුංග මහතා	- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) උතුරු මැද සහ වයඹ පළාත
6)	තමරා දමයන්ති මිය	- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) ඌව සහ සබරගමුව පළාත
7)	ඩබ්. එම්. පියරත්න මහතා	- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) දකුණු පළාත
7)	බී. ආර්. රණවීර මිය	- ගණකාධිකාරි
8)	පී. කේ. එන්. අසංගිකා මිය	- සහකාර අධ්‍යක්ෂ (පාලන)
9)	එන්. ජී. කේ. ඉන්දික මහතා	- සහකාර අධ්‍යක්ෂ (අලෙවි)
10)	බී. ඒ. එන්. එන්. බමුණුසිංහ මිය	- සහකාර අධ්‍යක්ෂ (රසායනික)

බැංකුකරුවෝ

ලංකා බැංකුව , කටුබැද්ද

මහජන බැංකුව, කටුබැද්ද

විගණනය

රජයේ විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

සභාපතිගේ පණිවිඩය

2020 වර්ෂය ආරම්භවීමත් සමඟ "සෞභාග්‍ය දැක්මේ" මග පෙන්වීම මත මෙතෙක් 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පණත හා ආයතන විෂය පථය තුළ කාර්යභාරය හා දිශානතිය දක්වමින් පළ කළ ගැසට් මගින් නව මානයකට යොමු කෙරිණි. ජාතික මෝස්තර මධ්‍යස්ථානය බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ස්වකීය අරමුණු හා හරයාත්මක වටිනාකම් සහිතව නව ජවයකින් පෙළ ගැසීමට ද සමත් විය.

කෙසේ වෙතත් 1983 ආරම්භක වසරෙන් පසු ඉතිහාසයේ වඩාත්ම අභියෝගාත්මක යුගයකට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ පුහුණු ක්‍රියාවලිය මුහුණ පෑවේ මේ වසරේදී ය. ඒ ගෝලීය ව්‍යසනයක් ලෙස පැමිණි කොවිඩ් - 19 වසංගතයත් සමඟය. මේ තත්වයට අනුගත වෙමින් දුරස්ථ අධ්‍යාපන උපාය මාර්ග අනුගමනය කරමින් අධ්‍යාපන කටයුතු වඩාත් විධිමත් කිරීමේ ක්‍රමවේදයක් සහ පැවති අභියෝගය හමුවේ විකල්ප පුහුණු ක්‍රමවේද අත්හදා බලමින් වඩාත් ගුණාත්මක ප්‍රතිඵල ලබා ගැනීමට අපට හැකි විය. මෙතෙක් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අවධානයට ලක්ව නොතිබූ බතික් නිෂ්පාදන ක්ෂේත්‍රය හා එහි මෝස්තර සම්පාදනය උදෙසා කළ කැපවීම මේ වසරේ කැපී පෙනෙන ප්‍රගතියක් දැක්වූවා පමණක් නොව එම අංශයේ රටේ කැපී පෙනෙන ප්‍රමුඛ රාජ්‍ය ආයතනය වීමට ද ජාතික මෝස්තර මධ්‍යස්ථානයට හැකි විය.

රටේ පැවති වාස්තවික තත්ත්වය සමාලෝචනය කරමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ භෞතික වශයෙන් ගරා වැටෙමින් තිබූ හා නවීකරණය වීමට අවශ්‍ය යටිතල පහසුකම් කල් තියා හඳුනා ගැනීමෙන් ඒ සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබාදීම හරහා කොවිඩ් වසංගත තත්වය මත වුවද මෙම වසරේ ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ඉදිරි සංවර්ධන කටයුතු සඳහා මනා සැලැස්මකින් නිම කිරීමට අපට හැකි විය.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මේ වසරේ සාර්ථකත්වය සඳහා ගරු කර්මාන්ත අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා කළ මහ පෙන්වීම හා දිරිය අගය කරන අතර රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමාත්, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලයත් අනලස්ව අප්‍රතිහත සහයෝගයක් දැක්වූ බව කිව යුතුමය. එමෙන්ම, අප ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලය මේ වසරේ අභියෝග මැද කළ කැපවීමට තුති පිදීමටත් මෙය අවස්ථාවක් කර ගනිමි.

අජිත් ජයවර්ධන,
සභාපති,
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

අධ්‍යක්ෂගේ පණිවිඩය

2020 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්යය සාධනය සමාලෝචනය කිරීමට සහ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලැබූ මහඟු වරප්‍රසාදයක් කොට සලකමි. ආයතනයේ මූලික අරමුණු වලට සහ ජාතික සංවර්ධන සැලසුම් වලට සමගාමීව ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් මෙම වර්ෂයේද යම් ප්‍රගතිගාමී ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව සඳහන් කළ හැකිය.

2020 වර්ෂයේ රට තුළ උද්ගත වූ කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද ආයතනයේ අරමුණු කරා ළඟා වීමට නව සභාපතිතුමාගේ මහ පෙන්වීම යටතේ අප ආයතනයට හැකියාව ලැබුණු අතර, ඒ සඳහා අමාත්‍යාංශයේ සහයෝගයද නොමඳව ලැබීම මහත් අස්වැසිල්ලක් වූ බව සඳහන් කළ යුතුමය.

2020 වර්ෂයේ නත්තරම්පොත කාර්යාලයේ බතික් ඒකකයක් ස්ථාපිත කිරීමට සැලසුම් කිරීමට අවස්ථාව ලැබීම විශේෂත්වයක් විය.

මෙම වර්ෂයේ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන් බතික් ක්ෂේත්‍රයට මුල් තැන දෙමින් සිදු කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මෙම වර්ෂයේ අවසන් කිරීමට හැකියාව ලැබුණු අතර, රතු මැටි ආශ්‍රිත නව නිර්මාණ කිහිපයක් සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට හැකියාව ලැබීමද විශේෂත්වයක් විය.

ඉහත කාර්යයන් සාර්ථකව සිදුකිරීම සඳහා අවශ්‍ය මහපෙන්වීම සහ අනුබල ලබාදුන් ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා සහ ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයටත් මාගේ කෘතවේදීත්වය මෙයින් පළකර සිටිමි.

එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි,

අධ්‍යක්ෂ,

ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

ආයතන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ
HM 1-3
MM 1-1
JM 1-1
MA 5-1
MA 3
MA 2-1
MA 1-1
PL 3
PL 1
ස.අ/නි.අ (මෝස්තර සංවර්ධන) (අංශ ප්‍රධානි/පළාත්)
ස.අ/නි.අ. (අලෙවි)
ස.අ/නි.අ. (රසායනික)
ස.අ/නි.අ. (නත්තරම්පොත)
ස.අ/නි.අ. (යාන්ත්‍රික)
ස.අ/නි.අ. (පාලන)
ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරි
ගිණුම් නිලධාරි
මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකාරක
මෝස්තර සම්පාදක
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
සංවර්ධන සහකාර
පුස්තකාල හා තොරතුරු සහකාර
සංවර්ධන සහකාර
පෞද්ගලික සහකාර.
පෞද්ගලික සහකාර.
ශිල්ප උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
ශිල්ප උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
රියැදුරු
රියැදුරු
කාර්යාල සහායක / මුරකරු
කාර්යාල සහායක / මුරකරු

මානව සම්පත

තනතුරු නාමය	සේවා ගණය	අනුමත	පවතින	පුරප්පාඩු
අධ්‍යක්ෂ	HM 1-3	01	01	-
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන)	MM 1-1	06	05	01
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	MM 1-1	01	01	-
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (යාන්ත්‍රික)	MM 1-1	01	-	01
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (රසායනික)	MM 1-1	01	01	-
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි)	MM 1-1	01	01	-
ගණකාධිකාරි	MM 1-1	01	01	-
ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරි (පෞද්ගලික වනසේ)	MM 1-1	01	01	-
පරිපාලන නිලධාරි	JM 1-1	02	01	01
ගිණුම් නිලධාරි	JM 1-1	02	02	-
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක	JM 1-1	04	04	-
අභ්‍යන්තර විගණන නිලධාරි	JM 1-1	01	01	-
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි	JM 1-1	01	01	-
සභා ලේකම්	JM 1-1	01	-	01
අලෙවි නිලධාරි	JM 1-1	01	-	01
මෝස්තර සම්පාදක	MA 5-1	09	03	06
වැඩසටහන් සම්බන්ධීකාරක	MA 5-1	01	-	01
පුස්තකාල හා තොරතුරු සහකාර	MA 3	01	-	01
සංවර්ධන සහකාර	MA 3	03	01	02
අලෙවි සහකාර	MA 3	01	-	01
පෞද්ගලික සහකාර	MA 2-1	02	01	01
කළමනාකරණ සහකාර	MA 1-1	13	08	05
ශිල්ප උපදේශක	MA 1-1	32	28	04
රියදුරු	PL 3	06 01 කොන්ත්‍රාත්	06	01 කොන්ත්‍රාත්
කාර්යාල සහායක	PL 1-1	17	13	04
මුරකරු	PL 1-1	04	03	01
පුහුණු සහායක (පෞද්ගලික වනසේ)	PL - 1	01	01	-
එකතුව		**116**	**84**	**32**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය - 2020

නව නිර්මාණ සැලසුම් කිරීම හා සංවර්ධන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, තම අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින්, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීමත්, ඒවා හස්ත කර්මාන්ත ශිල්පීන්ට විවිධ වැඩසටහන් ඔස්සේ හඳුන්වාදීමටත් ප්‍රමුඛව කටයුතු කරන අතර, එහි අතරමැදි කාර්යයක් වන සැලසුම් කළ නිර්මාණ අතුරින් තෝරාගත් නිර්මාණ සැලසුම් ජාතික මෝස්තර මධ්‍යස්ථාන වැඩහල් තුළ මූලික සාම්පල් බවට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම වර්ෂය තුළ නව නිර්මාණ සැලසුම් 700 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කර තිබූ අතර, ඒ යටතේ, ප්‍රධාන කාර්යාලයේ මෝස්තර අංශයෙන් හා නත්තරම්පොත ශාඛා කාර්යාලයෙන් නව නිර්මාණ 438 ක් සැලසුම් කිරීමට කටයුතු කර ඇත. ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල තුළ නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීම සඳහා එයින් නව නිර්මාණ 394 ක් වැඩහල වෙත හඳුන්වා දී ඇත. ඊට අමතරව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන යටතේ, නව නිර්මාණ ප්‍රදර්ශනය වෙනුවෙන්, පිටත ශිල්පීන්ගේ අවශ්‍යතා හා ඉල්ලීම මත නව නිර්මාණ 44 ක් සැලසුම් කර සෘජුව පිටත ශිල්පීන්ට හඳුන්වා දීමට කටයුතු කර ඇත.

පහත ආකාරයට එක් එක් හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල වෙත නව නිර්මාණ සැලසුම් ලබා දීමට මෝස්තර සංවර්ධන අංශය විසින් කටයුතු කර ඇත.

අංක	හස්ත කර්මාන්ත අංශය	සැලසුම් කළ නිර්මාණ ප්‍රමාණය
01	පත් හා කෙඳි අංශය	20
02	දැව අංශය	34
03	රෙදිපිළි අංශය	38
04	ලී හා වේවැල් අංශය	44
05	රත්‍රු මැටි අංශය	52
06	කොහු අංශය	27
07	ආභරණ අංශය	36
08	සම් අංශය	49
09	පිත්තල අංශය	43
10	ලාක්ෂා අංශය	51
	වැඩහල වෙත හඳුන්වා දී ඇති නව නිර්මාණ සංඛ්‍යාව	**394**
	පිටත ශිල්පීන්ගේ අවශ්‍යතා හා ඉල්ලීම මත මෝස්තර නිර්මාණ සංඛ්‍යාව	44
	සැලසුම් කරන ලද මුළු නිර්මාණ සංඛ්‍යාව	**438**

නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්තනය කිරීම

සැලසුම් කළ නව නිර්මාණ අතුරින් තෝරාගත් නිර්මාණ, මොරටුව හා නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුළ පිහිටි වැඩහල් හරහා මූලාදර්ශ බවට පත් කෙරේ. මෙහිදී සම්, පිත්තල හා ලාක්ෂා යන අංශ සඳහා සැලසුම් කරන ලද නව නිර්මාණ, නත්තරම්පොත වැඩහල තුළින් මූලාදර්ශ බවට පත් කෙරෙන අතර, පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව හා ආභරණ යන ක්ෂේත්‍ර මූලික කොට කරන ලද නිර්මාණ මොරටුව වැඩහල තුළ මූලාදර්ශ බවට පත් කෙරේ.

මෙම මූලාදර්ශ, නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන් යටතේ දිවයිනේ විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා ඒ ඒ ක්ෂේත්‍ර වලට අදාළව හඳුන්වාදෙනු ලබයි. එමෙන්ම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් පාදක කොට, මෙම නව නිර්මාණ මූලාදර්ශ හඳුන්වා දෙමින් පුහුණු වැඩසටහන් සිදු කරනු ලබයි.

හඳුන්වාදුන් නව නිර්මාණ හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් නිමි භාණ්ඩ බවට පත් කිරීමෙන් අනතුරුව, එම නිෂ්පාදන අලෙවි සල්පිල් හා ප්‍රදර්ශන හරහා අලෙවි කර ගැනීමට හා ඇණවුම් ලබා ගැනීමට ද ආයතනය විසින් අවස්ථාව සලසා දෙනු ලැබේ.

ඊට අමතරව, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය හා වෙනත් පෞද්ගලික වෙළඳ ආයතන හරහා ද මෙම නව නිර්මාණ, වෙළඳපොළට හඳුන්වාදෙනු ලබයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල් නව නිර්මාණ මූලාදර්ශ (Prototype Sample) බවට පරිවර්තනය කිරීම යටතේ 2020 වර්ෂයේ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ නව නිර්මාණ මූලාදර්ශ 500 ක් සකස් කිරීමට ඉලක්ක කළ අතර, ඒ ඔස්සේ නව නිර්මාණ මූලාදර්ශ 354 ක් වසර තුළ සකස් කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

එක් එක් ක්ෂේත්‍ර සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල වෙත හඳුන්වාදුන් නව නිර්මාණ සැලසුම් (Design) පහත ආකාරයට නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කරන ලදී.

මෙහිදී මොරටුව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල තුළ නව නිර්මාණ 229 ක් මූලාදර්ශ බවට පත් කර ඇති අතර, නත්තරම්පොත ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල තුළ නව නිර්මාණ 125 ක් මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කර ඇත.

අංක	හස්ත කර්මාන්ත අංශය	මූලික සාමාජික සංඛ්‍යාව	එකතුව
ප්‍රධාන කාර්යාලය			**229**
01	පන් හා කෙඳි අංශය	17	
02	දැව අංශය	28	
03	රෙදිපිළි අංශය	38	
04	උණ හා වේවැල් අංශය	41	
05	රතු මැටි අංශය	45	
06	කොහු අංශය	33	
07	ආභරණ අංශය	27	
නත්තරම්පොත කාර්යාලය			**125**
01	සම් අංශය	40	
02	පිත්තල අංශය	36	
03	ලාක්ෂා අංශය	49	

නව නිර්මාණ සංවර්ධන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම

- **ක්‍රියාකාරී සැලැස්ම යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංවිධානය කර පවත්වන ලද වැඩසටහන්**

ආයතනයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ, දැනුවත් කිරීමේ වැඩසටහන් හා මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන්, උපදේශාත්මක වැඩසටහන් ඇතුළුව නව නිර්මාණ හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 23 ක් පැවැත්වීමට හා ප්‍රතිලාභීන් 600 දෙනෙකුට ඒ හරහා පුහුණුව ලබාදීමට මෙම වසර තුළ ඉලක්ක කරන ලදී.

ඒ අනුව පහත ආකාරයට දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වමින් හා 197 දෙනෙකුට පුහුණුව ලබාදෙමින් නව නිර්මාණ හා නව තාක්ෂණය හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 07 ක් සිදු කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මගින් සිදුකරන ලද නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

අංක	වැඩසටහනේ ස්වභාවය	හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය	ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන	දිස්ත්‍රික්කය/ පැවැත්වූ ස්ථානය	ශිල්පීන් සංඛ්‍යාව	සම්බන්ධීකරණ ආයතන
01	දැනුම්වත් කිරීමේ වැඩසටහන	දැව	පෙබ. 05	පුත්තලම, හලාවත	15	වයඹ පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව
02	නව නිර්මාණ වැඩසටහන	රෙදිපිළි	මාර්තු 03 හා මාර්තු 04	මාතර, දෙනියාය	31	ජා.මෝ.ම
03	දැනුම්වත් කිරීමේ වැඩසටහන	තල්කොළ	2020.09.01 දින 01	ත්‍රිකුණාමලය	48	ජාතික ශිල්ප සභාව
04	නව නිර්මාණ වැඩසටහන		2020.09.23 දින 04			
05	නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	ලාක්ෂා	සැප්. 10 දින 04	හම්බන්තොට, බෙලිගල්ල, අහුල්මඩුව	25	ජා.මෝ.ම
06	නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	පිත්තල	සැප්. 09 දින 04	හම්බන්තොට, බෙලිගල්ල, අහුල්මඩුව	28	ජා.මෝ.ම
07	නව නිර්මාණ පුහුණු වැඩසටහන	උණ ලී	සැප්. 02 දින 02	කෑගල්ල, යටියන්තොට, පැලැල්ලේගම	15	ජා.මෝ.ම
08	නව තාක්ෂණික පුහුණු වැඩසටහන	රෙදිපිළි	ඔක්. 22 දින 04	කුරුණෑගල, රිදීගම, රම්බඩගල්ල	27	ජා.මෝ.ම
09	නව නිර්මාණ හා නව තාක්ෂණික වැඩසටහන	රතු මැටි	දෙසැ. 10 දින 04	කෑගල්ල, මොලගොඩ	23	ජා.මෝ.ම

- **රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් කරන ලද ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට හා ක්ෂේත්‍රයට නවක තරුණ කණ්ඩායම් සඳහා වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ හඳුන්වාදීම හා නව තාක්ෂණික දැනුම ලබා දීම සඳහා මූලික පුහුණු වැඩසටහන් හා උසස් පුහුණු වැඩසටහන් පහත ආකාරයට සිදු කරන ලදී.

අංක	වැඩසටහනේ ස්වභාවය	හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය	ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන	දිස්ත්‍රික්කය, ප්‍රා.ලේ.කොා. හා පැවැත්වූ ස්ථානය	ශිල්පීන් සංඛ්‍යාව	සම්බන්ධීකරණ ආයතන / මූල්‍ය දායකත්වය දැරූ ආයතන
01	නව තාක්ෂණික වැඩසටහන	රෙදිපිළි (විවිධ)	පෙබ. 23 දින 03	මොණරාගල, වැල්ලවාය	21	ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ආයතනය - වැල්ලවාය
02	නව නිර්මාණ හඳුන්වාදීමේ වැඩසටහන	රෙදිපිළි ආශ්‍රිත	පෙබ. 28 දින 02	මහනුවර, පිලිමතලාව	10	අපනයන සංවර්ධන මණ්ඩලය
03	නව නිර්මාණ හා නව තාක්ෂණික උපදේශනාත්මක වැඩසටහන	හණ	මාර්තු 11 දින 04	නුවරඑලිය, නිල්දණ්ඩාහින්න	20	කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය
04	නව නිර්මාණ උසස් පුහුණු වැඩසටහන	රෙදිපිළි (පේෂකර්මාන්ත)	අගෝ. 24 දින 04	මහනුවර, උඩුදුම්බර, තලගුණේ	24	කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය
05	නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන	හණ	සැප්. 17 දින 03	නුවරඑලිය, නිල්දණ්ඩාහින්න	18	පළාත් සංවර්ධන දෙපාර්තමේන්තුව
06	නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන	රෙක්සින්	ඔක්. 27 දින 01	මහනුවර	09	කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය

ඒ අනුව 2020 වර්ෂය තුළ නව නිර්මාණ හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 29 ක් සිදු කිරීමට ඉලක්ක කරන ලද අතර, ඒ යටතේ, නව නිර්මාණ හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 13 ක් දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ සිදු කරමින් ප්‍රතිලාභීන් 299 දෙනෙකුට නව නිර්මාණ, නව තාක්ෂණික දැනුම ලබා දෙමින්, වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ හඳුන්වාදීමට කටයුතු කරන ලදී.

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හඳුන්වාදීම

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය තුළ වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එසේ සැලසුම් කරන ලද නව නිර්මාණ විවිධ ආකාරයෙන් හස්ත කර්මාන්ත ශිල්පියා වෙත යොමු කරවීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි. ක්‍රියාකාරී සැලැස්ම යටතේ, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම යටතේ සිදුකරනු ලබන නව නිර්මාණ හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් හරහා ශිල්පීන්ගේ ඉල්ලීම හා අවශ්‍යතාවය මත ලබා දෙන නව නිර්මාණ සැලසුම් මඟින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හඳුන්වාදෙනු ලබයි.

ඒ අනුව ඉහත ආකාරයෙන් 2020 වර්ෂය තුළ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සැලසුම් කරන ලද නව නිර්මාණ 525 ක් හඳුන්වාදීමට ඉලක්ක කරන අතර, නව නිර්මාණ 230 ක් සත්‍ය වශයෙන් හඳුන්වාදීමට හැකි විය.

අලෙවි පර්යේෂණ වැඩසටහන්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීමේ අරමුණින් සැලසුම් කර මූලික සාම්පල බවට පත් කරන නව නිර්මාණ සඳහා අලෙවි පර්යේෂණ වැඩසටහන් අලෙවි අංශය හරහා සිදු කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳපොළෙන් එම නිර්මාණයන්ට අදාළව ලැබෙන ප්‍රතිචාර හා නිරීක්ෂණයන්, මෝස්තර අංශය වෙත ලබා දීම සිදු කරනු ලබන අතර, ඒ අනුව වෙළඳපොළ අවශ්‍යතාවන්ට වඩාත් ගැලපෙන නව නිර්මාණ සිදු කිරීමට අවශ්‍ය මඟපෙන්වීම මෙම අලෙවි පර්යේෂණ වැඩසටහන් හරහා සිදු කරනු ලබයි.

ඒ යටතේ,
ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 10 ක් යටතේ පවත්නා වැඩහල් හරහා එළිදැක්වෙන නව නිර්මාණ ආවරණය කරමින් පහත සඳහන් ආයතන මූලික කොට ඉලක්ක කළ පරිදි නව නිර්මාණ අලෙවි පර්යේෂණ වැඩසටහන් 04 ක් පවත්වන ලදී.

1. “ලක් ආකේඩ්” ආයතනය - කොළඹ 02 - ජනවාරි මස
2. “ලක්පහන” ආයතනය - කුරුදුවත්ත - ජනවාරි මස
3. “කළය” ආයතනය - බත්තරමුල්ල - ජූනි මස
4. “කැන්ඩ්” ආයතනය - කඩවත - ජූනි මස

හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළඳපොළ සම්බන්ධතා ගොඩනැංවීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරන ලද නව නිර්මාණ සඳහා වෙළඳපොළ සම්බන්ධතා ගොඩනැංවීම යටතේ ලක්සල, ලක්පහන හා පෞද්ගලික ගැනුම්කරුවකු හරහා හස්ත කර්මාන්ත ශිල්පීන් 18 දෙනෙකුට අවස්ථාව ලබා දී ඇත.

එමෙන්ම ඉහත ආයතන හා “නේචර් ලංකා” අපනයන ආයතනය හරහා අපනයන ප්‍රවර්ධන වැඩසටහනක් යටතේ නව නිර්මාණ 59 ක් වෙළඳපොළට හඳුන්වාදීමට මෙම වසර තුළ ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

හස්ත කර්මාන්ත නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන නව නිර්මාණ ප්‍රදර්ශනයට සමගාමීව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන 2020 වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නිර්මාණය කරනු ලබන නව නිර්මාණ, මෙම නිෂ්පාදන සංවර්ධන වැඩසටහන් හරහා දිවයින පුරා විසිරී සිටින ශිල්පීය හැකියාවෙන් යුත් හස්ත කර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදීම සිදු කරයි.

එමෙන්ම, ශිල්පීන්ට මෙම නව නිර්මාණ හඳුන්වාදීමේ දී, මෙම නිර්මාණ සිදු කිරීමට අවශ්‍ය දැනුම, තාක්ෂණය, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් ලබාදීම සිදු කරනු ලබන අතර, මෙම නව නිර්මාණ නිෂ්පාදනය කිරීම පිළිබඳ නිරන්තර පසු විපරම් කිරීම ද සිදු කරනු ලබයි.

එම මඟපෙන්වීම යටතේ, හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් ගුණාත්මක මට්ටමින් එම නිෂ්පාදන සිදු කරන අතර, මෙම වර්ෂයේ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන, බතික් ක්ෂේත්‍රයට මුල් තැන දෙමින් සිදු කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

ඒ අනුව, 2020 වර්ෂයේ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන යටතේ, බතික් ආශ්‍රිත නව නිර්මාණ 68 ක් හා අනෙකුත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මුළු නව නිර්මාණ 77 ක් හස්ත කර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදෙන ලදී.

අනෙකුත් ආයතන මඟින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන හා ආයතනයෙන් සංවිධානය කරන අනෙකුත් සංවර්ධන වැඩසටහන්

රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන මඟින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබා දෙන ලෙස වර්ෂය පුරා ඉල්ලීම් ලැබෙන අතර, රාජ්‍ය ආයතනයක් වශයෙන් අනිවාර්යයෙන් දායකත්වය දැක්විය යුතු ප්‍රදර්ශන සඳහා දායකත්වය දැක්වීමටත්, හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් හරහා උපකරණ බෙදාදීමේ වැඩසටහන් සංවිධානය කිරීමටත් ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

ඒ යටතේ, 2020 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1) රැකියා විරහිත තරුණ කණ්ඩායම් හා සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත කරුවන්ගේ ජීවන තත්වය නඟා සිටුවීමේ ව්‍යාපෘතිය යටතේ මන්නාරම් දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 99 දෙනෙකු සඳහා උපකරණ බෙදා දීමේ උත්සවය ජනවාරි මස පවත්වන ලදී.

2) “ඉනෝ ටෙක් ප්‍රදර්ශනය” - කොළඹ කාර්මික තාක්ෂණික ආයතනය විසින් සංවිධානය කර, මාර්තු මස 11 වෙනි දින සිට 14 වෙනි දින දක්වා පවත්වන ලද මෙම ප්‍රදර්ශනය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහභාගි වී නව නිර්මාණ එළිදැක්වීමට කටයුතු කරන ලදී.

පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ විශේෂිත මෙන්ම දුර්ලභ ගණයේ පොත් එකතුවක් සහිත ජාතික මෝස්තර මධ්‍යස්ථානයට අයත් පුස්තකාලය හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන සිසු සිසුවියන්ට මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ අධ්‍යයන කටයුතු වල යෙදෙන විශ්ව විද්‍යාල සිසුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

ඊට අමතරව හස්ත කර්මාන්ත ශිල්පීන්ට හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා අවශ්‍ය පුස්තකාල සේවා සැපයීම, තොරතුරු සැපයීම හා පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාව ද මේ හරහා සිදු කෙරේ.

අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරිත්වය

ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා ජාතික පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව හා ජාතික පිරිනිර්මාණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව මගින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ තරුණියන් හට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දෙමින් ඔවුන්ව වෘත්තිමය නිර්මාණකරුවන් ලෙස සවිබල ගැන්වීමට කටයුතු කරයි.

මෙම පාඨමාලාවන් හැදෑරීම තුළින් ලබාගන්නා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම යොදා ගනිමින් ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීමටත්, දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා උදාකර ගැනීමටත් ඔවුන්ට අවස්ථාව ලැබේ.

ඉහත පාඨමාලා සති අන්ත පාඨමාලා ලෙස ක්‍රියාත්මක කෙරෙන අතර මෙම වර්ෂය තුළ පාඨමාලාවන්ට සම්බන්ධ වූ සිසු සිසුවියන් පහත පරිදී වේ.

1. ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2019 - 2020 (සති අන්ත) මෙම පාඨමාලාව සඳහා සිසුන් 60 දෙනෙකු 2019 වර්ෂයේ බඳවාගත් අතර, එහි අධ්‍යයන කටයුතු මෙම වර්ෂයේද සිදු කරන ලදී.

2. ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2018 - 2020 (සති අන්ත) මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2018 වර්ෂයේ අග භාගයේ ආරම්භ කරන ලද අතර, ඒ සඳහා සිසුන් 34 දෙනෙකු බඳවා ගන්නා ලදී. 2020 වර්ෂයේදී ද එම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිදුකරන ලදි.

ජාතික මෝස්තර මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය වෙනුවෙන් අභිප්‍රේරණ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම - 2020

මෙම වර්ෂය තුළ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නිලධාරින්ව ඒ ඒ අංශයන්ට විශේෂිත වූ පුහුණු වැඩසටහන් සඳහා යොමු කළ අතර, මෙම ආයතනය හරහා රටට සිදුවිය යුතු සේවාවන් හා වගකීම් ඉතා කාර්යක්ෂමව, ඵලදායී ව උපරිම දායකත්වයෙන් යුතුව ඉටු කිරීමට අවශ්‍ය මහපෙන්වීම ලබා දීමේ අරමුණ ඇතිව සියළු කාර්ය මණ්ඩලය තුළ කණ්ඩායම් හැඟීම් වර්ධනය, සාමූහිකත්වය හා අන්‍යොන්‍ය සබැඳියාව වර්ධනය කිරීම සඳහා නායකත්ව පුහුණු ධනාත්මක ආකල්ප සංවර්ධනය ඇතුළත්ව අභිප්‍රේරණ සංවර්ධන වැඩසටහනක් 2020.01.20 දින සිදු කරන ලදී.

මෝස්තර හා භාණ්ඩ නිෂ්පාදන අමුද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම

නිෂ්පාදන ශිල්ප ක්‍රම, නව යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය සහ නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් හඳුන්වා දීම.

- මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය හා නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා නව සොයා ගැනීම් -

වේවැල් හා දැව යන අමුද්‍රව්‍ය සඳහා සහ ලාක්ෂා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික යන්ත්‍ර 02 ක් මෙම වර්ෂය තුළ නිපදවා ඇත.

01. **නිර්මාණය කරන ලද වේවැල් හා දැව යන අමුද්‍රව්‍ය සඳහා නව තාක්ෂණික යන්ත්‍රය**





02. **ලාක්ෂා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික යන්ත්‍රයක් නිපදවීම**





- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ලබාදුන් සණ අපද්‍රව්‍ය, මැටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් ලෙස භාවිත කිරීම පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

- වරක් භාවිතා කළ මැටි කිරි හට්ටි නැවත වරක් මී කිරි මිදවීමට භාවිතා කිරීම පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

- බතික් සඳහා යොදාගත හැකි සෞඛ්‍යාරක්ෂිත විකල්ප ඩයි වර්ග පිළිබඳ සොයා බැලීම.

- මැටි ජල පෙරන යන්ත්‍රය මඟින් ජලයේ ඇති රසායන ද්‍රව්‍ය ඉවත්වීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ජල සාම්පල යැවීමෙන් පරීක්ෂා කර ගැනීම.

තොරතුරු බැංකුවක් පවත්වාගෙන යෑම හා යාවත්කාලීන කිරීම

තොරතුරු බැංකුවක් පවත්වාගෙන යෑම හා යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කෙරෙන අතර, ඒ යටතේ, හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු ලබා ගැනීමට විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම හා ආයතනයේ තොරතුරු ඇතුළත් වෙබ් අඩවිය slndc.gov.lk යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාදීම

2020 වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම යටතේ, ආයතනය විසින් සංවිධානය කර පවත්වන ලද සහ වෙනත් ආයතන වල ඉල්ලීම් යටතේ හා රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවාවන් ලබාගත් ප්‍රතිලාභීන් 299 දෙනා ඇතුළත්ව ඇනවුම් හා අලෙවි අවස්ථා ලබාදීම, වෙළඳපළ, හස්ත කර්මාන්ත ශිල්පීන් , ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබා දීම, ආයතනයේ වැඩහල තුළ ප්‍රායෝගික පුහුණුව ලබා දීම, පොදු පහසුකම් ලබා දීම, ආයතනයට පැමිණ / ඉල්ලීම් මත මෝස්තර ලබා ගැනීම, වැඩසටහන් සඳහා සහභාගි වීමට අවස්ථාව ලබාදීම වැනි සේවාවන් හරහා සහ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හා අධ්‍යයන කටයුතු සිදුකරන දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල / පාසැල් සිසුන්ට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය මුල් කරගෙන සිදු කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම හා ආයතනයට කණ්ඩායම් වශයෙන් පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් අවශ්‍ය සේවාවන් ලබාදීම වැනි සේවාවන් යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය මෙම වසර තුළ ප්‍රතිලාභීන් 591 දෙනෙකු සඳහා සේවාවන් ලබා දීමට කටයුතු කර ඇත.

මෝස්තර උපදේශන සේවා

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වෘත්තීය මට්ටමේ මෝස්තර උපදේශන සේවා සැපයීම පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ සිදු කරනු ලැබේ.

- නිර්මාණ සඳහා වන සංකල්ප ගොඩනැගීම
- ගෘහ අභ්‍යන්තර නිර්මාණ කටයුතු
- ප්‍රදර්ශන වලට අදාළ නිර්මාණ කටයුතු (අභ්‍යන්තර හා බාහිර)
- සමරු තිළිණ, ස්මාරක සහ සිහිවටන නිර්මාණ
- ග්‍රැෆික් නිර්මාණ

2020 වර්ෂයේ ආයතනය මඟින් පහත සඳහන් මෝස්තර උපදේශක සේවාවන් සිදු කර ඇත.

උපදේශන සේවාව	කාර්යය ලබාදුන් ආයතනය	ව්‍යාපෘතියේ වටිනාකම රු.මි.
මාතලේ අලු විහාරය - තොරතුරු හා ප්‍රදර්ශන මධ්‍යස්ථානය - නිර්මාණ සැලසුම් හා ඉදිකිරීම්	වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත	1.16
හණ සැකසුම් යන්ත්‍රයක් සැපයීම	වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත	0.21
ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් "වන් ස්ටොප් ෂොප් " සේවා මධ්‍යස්ථාන පිහිටුවීමේ නියමු ව්‍යාපෘතිය - නිර්මාණ සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.	කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලිනව අවතැන් වූ පුද්ගලයන් නැවත ලියාපදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	අමාත්‍යාංශය වෙනුවෙන් හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් වෙනුවෙන් සිදු කර ඇති උපදේශන සේවා අය කිරීමකින් තොරව සිදු කර ඇත.
සීගිරිය හස්තකර්මාන්ත වෙළඳ මධ්‍යස්ථානය නිර්මාණ සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම	ජාතික ශිල්ප සභාව	
2020 නත්තල් උත්සවයේ ප්‍රධාන ජාතික දේව මෙහෙයට අදාළ නත්තල් සැරසිලි - ශාන්ත සෙබස්තියන් දේවස්ථානය - කඳාන	බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	0.3

එමෙන්ම, උපදේශන සේවා යටතේ හා පිටත ආයතන වල ඉල්ලීම මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 40 ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන්ට හා අනෙකුත් ආයතන වලින් ලද ඉල්ලීම් මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 63 ක් නිර්මාණ සැලසුම් කිරීමට මෝස්තර හා සංවර්ධන අංශය කටයුතු කර ඇත.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම

මොරටුව කටුබැද්දේ පිහිටි ජාතික මෝස්තර මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ පැරණි ගොඩනැගිල්ල ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා විමධ්‍යගත අයවැය තුළින් රු.මි. 80 ක මුදලක් 2017 වර්ෂයේ අනුමත වූ අතර, එහි ඉදිකිරීම් කටයුතු මෙම වර්ෂයේ නිම කෙරුණි.

විශේෂිත ක්‍රියාකාරකම්

- **නව නිර්මාණ සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගැනීම**

රතුමැටි ආශ්‍රිත පහත දක්වා ඇති නව නිර්මාණය සඳහා මෙම වසරේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයට පේටන්ට් බලපත්‍රය ලබාගැනීමට හැකියාව ලැබුණි.



❖ **ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල වැඩහල් පරිශ්‍රය අලුත්වැඩියා කිරීම**

මෙම කාර්යය ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ බහුතරයකගේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කෙරුණි.







ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදු කළ සංවර්ධන ක්‍රියාකාරම්හි ප්‍රගතිය

වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම්	වෙන් කිරීම් රු.මි.	මූල්‍ය ප්‍රගතිය රු.මි.	කාර්ය සාධන නිර්ණායක	ඉලක්කය	සපුරා ගැනීම්
හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා නව නිෂ්පාදන / නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්	3.735	0.983	ආයතනය විසින් සැලසුම් කර පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	23	07
			පූහුණුව ලැබූ ශිල්පීන් සංඛ්‍යාව	600	197
			හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව	525	230
ඉල්ලීම් මත නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්	0.600+ බාහිර ප්‍රතිපාදන	0.013	වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව	06	06
			පුහුණුව ලැබූ ශිල්පීන් සංඛ්‍යාව	120	102
ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන්හි ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම් වැඩසටහන් පැවැත්වීම	0.300	0.006	අධීක්ෂණය හා ඇගයීම් වැඩසටහන් සංඛ්‍යාව	03	01
ජා.මෝ.ම. වැඩහල් තුළ පුහුණුව ලබාදීම	--	--	පුහුණුව ලැබූ හස්තකර්මාන්ත ශිල්පීන් /සිසුන් සංඛ්‍යාව	60	67
සිසුන් හා ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන පිරිස් සඳහා පොදු පහසුකම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	--	--	සේවා ලබාගත් සංඛ්‍යාව	600	207
හස්ත කර්මාන්ත ශිල්පීන්ට හා ව්‍යවසායකයන්ට පුස්තකාල සේවා සැපයීම	--	0.188	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	30	--
හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ දැනුම හා හැකියාවන් ඉහළ නැංවීම සඳහා අදාළ පොත් හා සඟරා පුස්තකාලය වෙත ලබාදීම	0.200				

වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම්	වෙන් කිරීම් රු.මි.	මූල්‍ය ප්‍රගතිය රු.මි.	කාර්ය සාධන නිර්ණායක	ඉලක්කය	සපුරා ගැනීම්
අලෙවි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම	0.150	0.014	වැඩසටහන් සංඛ්‍යාව	4	4
			අලෙවි පර්යේෂණ වැඩසටහන් හරහා වෙළඳපොළට හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව	30	59
වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදීම	0.300	0.196	නව නිර්මාණ සැලසුම් සංඛ්‍යාව	700	438
නව නිර්මාණ සැලසුම් සඳහා ලිපිද්‍රව්‍ය ලබාදීම					
මෝස්තර අංශයේ ධාරිතා සංවර්ධනය (උපකරණ, විද්‍යුත් මාධ්‍ය) - ප්‍රධාන කාර්යාලය	0.703	0.115			
නත්තරම්පොත කාර්යාලයේ මෝස්තර අංශයේ ධාරිතා සංවර්ධනය (උපකරණ ලබාදීම)	0.365	0.286			
නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල බවට පත්කිරීම සඳහා අමුද්‍රව්‍ය ලබාදීම, පිටත ශිල්පීන් හරහා මූලාශ්‍ර සාම්පල සකස් කර ගැනීම	1.062	0.840	නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල සංඛ්‍යාව	500	354
ජා.මෝ.ම. වැඩහල සඳහා ධාරිතා සංවර්ධනය වැඩි දියුණු කිරීම (යන්ත්‍ර සූත්‍ර හා උපකරණ)	1.847	0.951			
නිෂ්පාදන ශිල්ප ක්‍රම, නව යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය සහ නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් හඳුන්වාදීම	0.725	0.310	මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය සහ නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා නව සොයා ගැනීම් සංඛ්‍යාව	02	01
යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශනයට සමගාමීව නව නිර්මාණ හා නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	2.500	1.249	හස්තකර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදෙන ලද වෙළඳපොළ ප්‍රවලිත නව නිර්මාණ සංඛ්‍යාව	350	77
යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශනය පැවැත්වීම	7.000	1.028	නව නිර්මාණ ප්‍රදර්ශන සංඛ්‍යාව	01	--
			ප්‍රදර්ශනය හරහා හඳුන්වාදෙනු ලැබූ වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සංඛ්‍යාව	280	--
			වෙළඳපොළ සම්බන්ධතා සංඛ්‍යාව (ශිල්පීන්)	100	18
			ප්‍රදර්ශනය හා අලෙවි පර්යේෂණ හරහා ආදායම	රු.මි. 1.500	රු.මි. 0.242

වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම්	වෙන් කිරීම් රු.මි.	මූල්‍ය ප්‍රගතිය රු.මි.	කාර්ය සාධන නිර්ණායක	ඉලක්කය	සපුරා ගැනීම්
අනෙකුත් ආයතන සංවිධානය කරනු ලැබූ ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය	0.750	0.244	ප්‍රදර්ශන හා විශේෂිත සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	04	02
හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය හා ආයතනික සේවා සම්බන්ධ විදෘශ්‍ය ප්‍රලේඛනය	1.000	0.885	විදෘශ්‍ය ප්‍රලේඛන	01	01
මෝස්තර උපදේශන සේවා	බාහිර ප්‍රතිපාදන		සැපයූ මෝස්තර උපදේශන සේවා සංඛ්‍යාව	03	05
ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර නව නිර්මාණ සැලසුම් කිරීම			සැලසුම් කරන ලද ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර නව නිර්මාණ සංඛ්‍යාව	40	63
නිර්මාණ ක්ෂේත්‍රය සඳහා පිළිගත් පාඨමාලා හඳුන්වාදීම	ඉපයීම් මත				
ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ ඇති පිරිනිර්මාණ විද්‍යාලය හරහා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම			ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව	70	--
උසස් ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම			උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව	30	--
			ඉපයීම් ආදායම	රු.මි. 5	රු.මි. 2.126
කාර්ය මණ්ඩල පුහුණුව	0.600	0.323	පුහුණුව ලැබූ සංඛ්‍යාව	139	116
අභ්‍යන්තර යටිතල පහසුකම් (ගොඩනැගිලි)	2.112	0.830	නිම කිරීමේ ප්‍රතිශතය	100%	75%
පිරිනිර්මාණ විද්‍යාලය (කුලී ගොඩනැගිල්ල සඳහා)	1.020 (ඉපයීම් මත)	0.850 (ඉපයීම් මත)	නිම කිරීමේ ප්‍රතිශතය	100%	83%

සහායක අංශ සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම	1.599	1.602	නිමකිරීමේ ප්‍රතිශතය	100%	75%
නව ගොඩනැගිල්ලේ වායු සමීකරණ සවි කිරීම	3.970	0.738			60%
නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු	19.374	7.347			98%
මුළු ප්‍රාග්ධන වෙන්කිරීම්	**48.892**	**18.148**			

2020 වර්ෂයේ මුල් කාර්තුව තුළ උද්ගත වූ කොවිඩ් වසංගතය සමඟ රජයේ අනුමැතිය පරිදි කාර්යය මණ්ඩලයේ පැමිණීම සීමා කිරීමට සිදු වූ අතර, ආයතනයේ ප්‍රමුඛ සංවර්ධන කාර්යයක් වශයෙන් හැඳින්විය හැකි නව නිර්මාණ පුහුණු වැඩසටහන්ද සීමා කිරීමට සිදුවිය. එයට ප්‍රධාන හේතුව ලෙස ආයතනයේ පුහුණු වැඩසටහන් දිවයින පුරා විවිධ ප්‍රදේශ වල සිදුකරන අතර, උක්ත හේතුව මත ශිල්පීන් රැස් කිරීම හා නිලධාරීන්ට විවිධ ප්‍රදේශවලට යෑම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි වූ බැවින් පුහුණු වැඩසටහන් සඳහා වෙන්කරන ලද මුදල් වැයකොට අපේක්ෂා කළ පරිදි ඉලක්කගත පුහුණු වැඩසටහන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. එමෙන්ම ආයතනය වාර්ෂිකව පවත්වනු ලබන නව නිර්මාණ ප්‍රදර්ශනයද මහජනතාව රැස් කිරීමේ සීමා මත සංවිධානය කිරීම සිදුනොවුනි. එබැවින් ඒ සඳහා වෙන් කරන ලද මුදලද වැය නොකෙරුනි.

තවද ප්‍රාග්ධන ප්‍රතිපාදන රු. 48.892 අනුමත වුවද උග්‍රව පැවති වසංගත තත්ත්වය මත භාණ්ඩාගාරයෙන් නිදහස් කර ගැනීමට හැකි වූයේ රු. මි. 21.4 කි. එම රු. මි. 21.4 න් සත්‍ය වශයෙන් වියදම් වූයේ රු. මි. 18.148කි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ පනත ප්‍රකාරව පැවරුණු කාර්යයන්හි ප්‍රගතිය

පනත ප්‍රකාරව පැවරුණු කාර්යයන්	ඉටු කිරීමට අදාළව ඇස්තමේන්තු කාර්යයන්	2020 වර්ෂය සඳහා වෙන් කෙරුණු මුදල රු.මි.	2020 දෙසැම්බර් 31 දිනට සිදුකළ කාර්යයන්	සත්‍ය වියදම රු.මි.	ක්‍රියාත්මක කළ දිස්ත්‍රික්කය
(අ) i - කුඩා කර්මාන්ත සඳහා මෝස්තර සම්පාදනය	වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ 700 ක් (පන් හා කෙඳි, රතුමැටි, කොහු , උණ හා වේවැල් ,රෙදිපිළි, දැව, ආභරණ, සම්, පිත්තල හා ලාක්ෂා යන ක්ෂේත්‍ර මූලික කොට) සැලසුම් කිරීම		පන් හා කෙඳි, රතු මැටි , කොහු , උණ හා වේවැල්, රෙදිපිළි, දැව, ආභරණ, සම්, පිත්තල හා ලාක්ෂා යන ක්ෂේත්‍ර ප්‍රධාන කොට නව නිර්මාණ 438ක් සැලසුම් කර ඇත.		කොළඹ, මහනුවර
	නව නිර්මාණ සැලසුම් සඳහා ලිපි ද්‍රව්‍ය ලබාදීම	0.300	නව නිර්මාණ සැලසුම් සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබාදෙන ලදී.	0.196	
	මෝස්තර අංශයේ ධාරිතා සංවර්ධනය (උපකරණ, විද්‍යුත් මාධ්‍ය) - ප්‍රධාන කාර්යාලය	0.703	ප්‍රධාන කාර්යාලයේ මෝස්තර අංශයේ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය උපකරණ ලබාදෙන ලදී.	0.115	කොළඹ
	නත්තරම්පොත කාර්යාලයේ මෝස්තර අංශයේ ධාරිතා සංවර්ධනය (උපකරණ ලබාදීම)	0.365	නත්තරම්පොත කාර්යාලයේ මෝස්තර අංශයේ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය උපකරණ ලබාදෙන ලදී.	0.286	මහනුවර
	නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල 500ක් සකස් කිරීම සඳහා ජා.මෝ.ම.වැඩහල් වෙත අමුද්‍රව්‍ය ලබාදීම හා එම වැඩහල් තුළ සකස් කළ නොහැකි නව නිර්මාණයන්හි මූලාශ්‍ර සාම්පල බාහිර ශිල්පීන් මඟින් සකස් කර ගැනීම	1.062	නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල බවට පත්කිරීම සඳහා අමුද්‍රව්‍ය ලබාදෙන ලද අතර, මේ හරහා නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල 354 ක් කටුබැද්ද හා නත්තරම්පොත වැඩහල් තුළ සකස් කිරීමට කටයුතු කර ඇත.	0.840	කොළඹ, මහනුවර
	ජා.මෝ.ම. වැඩහල සඳහා ධාරිතා සංවර්ධනය වැඩි දියුණු කිරීම (යන්ත්‍ර සූත්‍ර හා උපකරණ)	1.847	ජා.මෝ.ම. වැඩහල සඳහා ධාරිතා සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලබාදෙන ලදී.	0.951	කොළඹ, මහනුවර

පනත ප්‍රකාරව පැවරුණු කාර්යයන්	ඉටු කිරීමට අදාළව ඇස්තමේන්තු කාර්යයන්	2020 වර්ෂය සඳහා වෙන් කෙරුණු මුදල රු.මි.	2020 දෙසැම්බර් 31 දිනට සිදුකළ කාර්යයන්	සත්‍ය වියදම රු.මි.	ක්‍රියාත්මක කළ දිස්ත්‍රික්කය
(අ) ii- මෝස්තර හා භාණ්ඩ නිෂ්පාදන අමුද්‍රව්‍ය සම්බන්ධ පරීක්ෂණ සිදු කිරීම	නිෂ්පාදන ශිල්ප ක්‍රම, නව යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය සහ නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් හඳුන්වාදීම	0.725	මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය සහ නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා නව සොයාගැනීම් - වේවැල් හා දැව යන අමුද්‍රව්‍ය සඳහා සහ ලාක්ෂා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික යන්ත්‍ර 02 ක් නිපදවා ඇත.	0.274	කොළඹ, මහනුවර
			ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මඟින් ලබාදුන් සණ අපද්‍රව්‍ය, මැටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීම පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කිරීම	0.036	කොළඹ කළුතර ගම්පහ
			වරක් භාවිත කළ මැටි කිරි හට්ටි නැවත වරක් මීකිරි මිදවීමට භාවිත කිරීම පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කිරීම		
			බතික් සඳහා යොදාගත හැකි සෞඛ්‍යාරක්ෂිත විකල්ප ඩයි වර්ග පිළිබඳ සොයා බැලීම මැටි ජල පෙරන යන්ත්‍රය මඟින් ජලයේ ඇති රසායන ද්‍රව්‍ය ඉවත්වීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ජල සාම්පල යැවීමෙන් පරීක්ෂා කර ගැනීම		

පනත ප්‍රකාරව පැවරුණු කාර්යයන්	ඉටු කිරීමට අදාළව ඇස්තමේන්තු කාර්යයන්	2020 වර්ෂය සඳහා වෙන් කෙරුණු මුදල රු.මි.	2020 දෙසැම්බර් 31 දිනට සිදුකළ කාර්යයන්	සත්‍ය වියදම රු.මි.	ක්‍රියාත්මක කළ දිස්ත්‍රික්කය
(ආ) හස්තකර්මාන්ත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපල සංවර්ධනය කිරීම	නව නිර්මාණ වෙළඳපොළට හඳුන්වාදීම සඳහා අලෙවි පර්යේෂණ වැඩසටහන් 04 ක් පැවැත්වීම.	0.150	නව නිර්මාණ වෙළඳපොළට හඳුන්වාදීම සඳහා අලෙවි පර්යේෂණ වැඩසටහන් 04 ක් පවත්වන ලදී.	0.014	කොළඹ
	ඒ හරහා නව නිර්මාණ 30 ක් වෙළඳපොළට හඳුන්වාදීම.		ඒ හරහා නව නිර්මාණ 59 ක් වෙළඳපොළට හඳුන්වාදෙන ලදී.		
	යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශනයට සමගාමීව නව **නිර්මාණ හා නව නිෂ්පාදන සංවර්ධන** වැඩසටහන හරහා වෙළඳපොළට වඩාත් ගැලපෙන නව නිර්මාණ 350 ක් ශිල්පීන්ට හඳුන්වාදී ඒ හරහා නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම.	2.500	යුගයට නිමැවුම් නව නිර්මාණ හා නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන හරහා වෙළඳපොළට වඩාත් ගැලපෙන නව නිර්මාණ 77 ක් ශිල්පීන්ට හඳුන්වාදී ඒ හරහා නිෂ්පාදනය කිරීමට කටයුතු කරන ලදී.	1.249	කොළඹ
(ආ) හස්ත කර්මාන්ත භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සංවර්ධනය කිරීම.	දේශීය හා විදේශීය ගැණුම්කරුවන් ඉලක්ක කර නව නිර්මාණ ප්‍රදර්ශනය පැවැත්වීම	7.000	ප්‍රදර්ශනය සංවිධානය කිරීමට අදාළ මූලික කටයුතු සිදු කරන ලදී	1.028	කොළඹ
	ප්‍රදර්ශනය හරහා වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ 280 ක් හඳුන්වාදීම		ප්‍රදර්ශනය ඉලක්ක කර, වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සකස් කරනු ලැබුව ද, ප්‍රදර්ශනය පැවැත්වීමට නොහැකි වූ බැවින්, එම නිර්මාණ එළිදැක්විය නොහැකි විය.		

	අලෙවි පර්යේෂණ වැඩසටහන් හා ප්‍රදර්ශන හරහා හස්ත කර්මාන්ත ශිල්පීන් 100 දෙනෙකු වෙළඳපළට යොමු කරවමින් වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම		අලෙවි පර්යේෂණ හරහා රු.මි. 0.242 ආදායමක් ලබා ගන්නා ලදී.		
	ප්‍රදර්ශනය හා අලෙවි පර්යේෂණ හරහා රු.මි. 1.500 ආදායමක් ලබාගැනීම		අලෙවි පර්යේෂණ හරහා රු. මි. 0.242 ආදායමක් ලබා ගන්නා ලදී		
	අනෙකුත් ආයතන සංවිධානය කරන ප්‍රදර්ශන හා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ විවිධ අංග 04 ක් සඳහා සහභාගීත්වය	0.750	අනෙකුත් ආයතන සංවිධානය කරන ප්‍රදර්ශන හා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ විවිධ අංග 02 ක් සඳහා සහභාගීත්වය	0.244	කොළඹ මන්නාරම
	හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය හා ආයතනික සේවා සම්බන්ධ විදෘශ්‍ය ප්‍රලේඛන (වීඩියෝ සවිස්තරය) 01 ක් සකස් කිරීම	1.000	හස්තකර්මාන්ත ප්‍රවර්ධනය හා ආයතනික සේවා සම්බන්ධ විදෘශ්‍ය ප්‍රලේඛන (වීඩියෝ සවිස්තරය) 01 ක් සකස් කරන ලදී.	0.885	කොළඹ - මහනුවර
(ඇ) කාර්යක්ෂමව හස්ත කර්මාන්ත නිෂ්පාදනය කිරීමට ක්‍රියා කිරීම.	ක්‍රියාකාරී සැලැස්ම යටතේ වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් නව නිර්මාණ හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 26 ක් පැවැත්වීම හා ඒ හරහා ප්‍රතිලාභීන් 600 දෙනෙකු සඳහා නව නිර්මාණ හා නව තාක්ෂණික දැනුම ලබාදීම.	3.735	ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 07 ක් පවත්වා ප්‍රතිලාභීන් 197 දෙනෙකු සඳහා නව නිර්මාණ හා නව තාක්ෂණික දැනුම ලබා දෙන ලදී	0.983	මාතර ත්‍රිකුණාමලය හම්බන්තොට කෑගල්ල කුරුණෑගල
	නව නිර්මාණ පුහුණු වැඩසටහන් හරහා හා හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම මත නව නිර්මාණ 525 ක් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වා දීම.	--	නව නිර්මාණ පුහුණු වැඩසටහන් හරහා හා හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම මත නව නිර්මාණ 525 ක් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වා දීම.	--	කොළඹ මහනුවර මාතර ත්‍රිකුණාමලය හම්බන්තොට කෑගල්ල කුරුණෑගල

	බාහිර ආයතන වල ඉල්ලීම මත, ජා.මෝ.ම දායකත්වය හා බාහිර ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 06 පැවැත්වීම හා ඒ හරහා 120 දෙනෙකුට සේවා සැපයීම.	0.600+ බාහිර ප්‍රතිපාදන	පිටත ආයතන වල ඉල්ලීම මත, ජා.මෝ.ම දායකත්වය හා බාහිර ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 06 පැවැත්වීම හා ඒ හරහා 102 දෙනෙකුට සේවා සැපයීම.	0.013+ බාහිර ප්‍රතිපාදන	මොනරාගල නුවරඑළිය මහනුවර
(ඇ) කාර්යක්ෂමව හස්ත කර්මාන්ත නිෂ්පාදනය කිරීමට ක්‍රියා කිරීම	ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සඳහා ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම් වැඩසටහන් 03 ක් පැවැත්වීම.	0.300	ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සඳහා ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම් වැඩසටහන් 01 ක් පවත්වන ලදී.	0.006	හම්බන්තොට
	ඉල්ලීම මත ජා.මෝ.ම වැඩහල් තුළ 60 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම.	--	ඉල්ලීම මත ජා.මෝ.ම වැඩහල් තුළ 67 දෙනෙකු සඳහා පුහුණුව ලබාදෙන ලදී.	--	කොළඹ මහනුවර
	ආයතනයට පැමිණෙන සිසුන් හා ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන්නන් 600 දෙනෙකු සඳහා පොදු පහසුකම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	--	ආයතනයට පැමිණෙන සිසුන් හා ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන්න 207 දෙනෙකු සඳහා පොදු පහසුකම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.	--	කොළඹ මහනුවර
(ඈ) හස්ත කර්මාන්ත භාණ්ඩ සකසුරුවම් හා කාර්යක්ෂමව නිෂ්පාදනය කිරීම සඳහා යාන්ත්‍රීකරණය ඇති කිරීම පිළිබඳ සලකා බැලීම.	මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය හා නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා නව සොයා ගැනීම් 02ක් සිදු කිරීම.	(අ) II යටතේ සඳහන් කර ඇත.	මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය හා නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා නව සොයා ගැනීම් - වේවැල් හා දැව යන අමුද්‍රව්‍ය සඳහා සහ ලාක්ෂා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික යන්ත්‍ර 02ක් නිපදවා ඇත.		කොළඹ මහනුවර
(ඉ) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට හා ශිල්පීන්ට හස්ත කර්මාන්ත භාණ්ඩ	ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිදු කරනු ලබන නව නිර්මාණ හස්ත කර්මාන්ත ශිල්පීන් හරහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට හඳුන්වා දීම.	--	ජාතික මෝස්තර මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබන නව නිර්මාණ හස්ත කර්මාන්ත ශිල්පීන් හරහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට හඳුන්වා දීමට කටයුතු කර ඇත.	--	කොළඹ

නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා උපදෙස් දීම හා සහය වීම.	නව නිර්මාණ හා තාක්ෂණික සංවර්ධන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් හරහා ශිල්පීන්ට හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා උපදෙස් දීම හා සහය වීම.	(ඇ) යටතේ සඳහන් කර ඇත.	නව නිර්මාණ හා තාක්ෂණික සංවර්ධන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් හරහා ශිල්පීන්ට හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා උපදෙස් දීම හා සහය වීම.		කොළඹ මහනුවර මාතර තිකුණාමලය හම්බන්තොට කෑගල්ල කුරුනෑගල මොණරාගල නුවරඑළිය
	ඉල්ලීම මත ජා.මෝ.ම වැඩහල් තුළ 60 දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම.		ඉල්ලීම මත ජා.මෝ.ම වැඩහල් තුළ 67 දෙනෙකු සඳහා පුහුණුව ලබා දෙන ලදී.		
	ආයතනයට පැමිණෙන සිසුන් හා ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන 600 දෙනෙකු සඳහා පොදු පහසුකම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.		ආයතනයට පැමිණෙන සිසුන් හා ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන 207 දෙනෙකු සඳහා පොදු පහසුකම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.		
(ඊ) අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීම	--	--	ස්වාභාවික වර්ණක භාවිතයෙන් බතික් කරනු ලබන ව්‍යවසායකයෙකු හට ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදය පිළිබඳ තොරතුරු සොයා බලා ඒ පිළිබඳ දැනුම්වත් කිරීම හා බතික් සඳහා භාවිතා කළ හැකි ඩයි වර්ග වල ප්‍රමිතියට අදාළ තොරතුරු පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීම පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් සිදු කර ඇත.	--	කොළඹ
(උ) තොරතුරු බැංකුවක් පවත්වාගෙන යෑම.	ආයතනය මඟින් පවත්වන පුහුණු වැඩසටහන් වල හා ඒ සඳහා සහභාගි වන හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු ඇතුළත් තොරතුරු බැංකුවක් පවත්වාගෙන යෑම.	--	ආයතනය මඟින් පවත්වන පුහුණු වැඩසටහන් වල හා ඒ සඳහා සහභාගි වන හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු ඇතුළත් තොරතුරු බැංකුවක් පවත්වාගෙන යෑම.	--	කොළඹ

	හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින්, ශිල්පීන් හා සිසුන් ඇතුළත්ව 30 දෙනෙකු සඳහා පුස්තකාල සේවා සැපයීම.	--	නව ගොඩනැගිල්ලේ පුස්තකාලය ස්ථාපිත කිරීමේ කටයුතු සිදුවූ බැවින්, බාහිර පුද්ගලයින් සඳහා පුස්තකාලය විවෘත කිරීම සිදු නොවුණි.	--	කොළඹ
	පුස්තකාලය සඳහා, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පොත් හා සඟරා මිලදී ගැනීම.	0.200	පුස්තකාලය සඳහා, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පොත් හා සඟරා මිලදී ගැනීම.	0.188	කොළඹ මහනුවර
(උ) සපයන සේවා සඳහා ගාස්තු අය කිරීම.	ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ ඇති පිරිනිර්මාණ විද්‍යාලය හරහා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම - ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 70 ක් හා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 30ක් බඳවා ගැනීම.	ඉපයීම් මත	මෙම වසරේ සිසුන් බඳවා ගැනීම සිදු නොවුණු අතර, ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2019-2020 හා 2018-2020 උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යන ලද අතර, මුළු පාඨමාලාව සඳහා එක් සිසුවකුගෙන් රු.90,000ක ගාස්තුවක් වාරික යටතේ අය කිරීම.	ඉපයීම් මත	කොළඹ
	මෝස්තර උපදේශන සේවා 03 ක් සිදු කිරීම - රාජ්‍ය හා අනෙකුත් ආයතන වල ඉල්ලීම මත අභ්‍යන්තර හා බාහිර අලංකරණ කටයුතු , ඒ ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු, සම්මාන හා තිළිණ නිර්මාණ , ත්‍රිමාණ නිර්මාණ සිදුකිරීම.		මෝස්තර උපදේශන සේවා 05ක් සිදු කරන ලදී.		මාතලේ මහනුවර මොණරාගල ගම්පහ
	ගැෆික් හා ගෘහ අභ්‍යන්තර නව නිර්මාණ සැලසුම් 40 ක් සිදු කිරීම.		ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර නව නිර්මාණ සැලසුම් 63 ක් සිදු කරන ලදී.		කොළඹ

(එ) රසායනාගාර වැඩපළවල් සහ වෙනත් ආයතන පවත්වාගෙන යෑම.	ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ, පර්යේෂණ හා සංවර්ධන අංශය යටතේ රසායනාගාරයක් පවත්වාගෙන යෑම. ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන ශාඛා කාර්යාලයක් මහනුවර - නත්තරම්පොත පවත්වාගෙන යෑම.	--	ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ, පර්යේෂණ හා සංවර්ධන අංශය යටතේ රසායනාගාරයක් පවත්වාගෙන යෑම. ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන ශාඛා කාර්යාලයක් මහනුවර - නත්තරම්පොත පවත්වාගෙන යෑම.	--	කොළඹ මහනුවර
	ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය පවත්වාගෙන යෑම.	--	ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය පවත්වාගෙන යෑම.	--	
(ඒ) ආයතනයේ පරමාර්ථ වලට මුළුමනින්ම හෝ අඩ වශයෙන් සමාන පරමාර්ථ ඇති දේශීය හෝ විදේශීය ආයතන සමඟ රජයේ අනුමැතිය ඇතිව එකඟතා වලට එළඹීම.	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව හා එක්ව අවබෝධතා ගිවිසුමක් යටතේ ජාතික පිරිනිර්මාණ විද්‍යාලය පවත්වාගෙන යෑමට පහසුකම් සැපයීම.	--	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව හා එක්ව අවබෝධතා ගිවිසුමක් යටතේ ජාතික පිරිනිර්මාණ විද්‍යාලය පවත්වාගෙන යෑමට පහසුකම් සැපයීම.	--	
	ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් කරනු ලබන නව නිර්මාණ වෙළඳපොළට හඳුන්වා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සමඟ එළඹී එකඟතාවයකට අනුව කටයුතු කිරීම.		ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් කරනු ලබන නව නිර්මාණ වෙළඳපොළට හඳුන්වා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සමඟ එළඹී එකඟතාවයකට අනුව කටයුතු කිරීම.		කොළඹ

ඉදිරි සැලසුම් - 2021 වර්ෂය සඳහා

ව්‍යාපෘතිය	වෙන් කළ මුදල	ක්‍රියාකාරකම්	නිර්නායක	වාර්ෂික ඉලක්ක
හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා නව නිෂ්පාදන නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් - ආයතනය විසින් සැලසුම් කර පවත්වනු ලබන/ ඉල්ලීම් මත නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්	9.795	දැනුම්වත් කිරීමේ වැඩසටහන්/ මූලික පුහුණු වැඩසටහන්/ උසස් පුහුණු වැඩසටහන් පැවැත්වීම.	ආයතනය විසින් සැලසුම් කර පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	35
			පුහුණුව ලබන ශිල්පීන් සංඛ්‍යාව	825
			හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා හඳුන්වාදෙන නව නිර්මාණ සංඛ්‍යාව	600
			වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් පවත්වන වැඩසටහන් සංඛ්‍යාව	06
			පුහුණුව ලබන ශිල්පීන් සංඛ්‍යාව	120
මෝස්තර සංවර්ධනය, දැනුම ඉහල නැංවීම හා කුසලතා සංවර්ධනය	2.475	<u>වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වා දීම.</u>		
		නව නිර්මාණ සැලසුම් සඳහා ලිපි ද්‍රව්‍ය ලබා දීම.	නව නිර්මාණ සැලසුම් සංඛ්‍යාව	700
		නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල බවට පත්කිරීම සඳහා අමුද්‍රව්‍ය ලබා දීම.	නව නිර්මාණ මූලාශ්‍ර සාම්පල සංඛ්‍යාව	550
		හස්ත කර්මාන්ත ශිල්පීන්ට / සිසුන්ට ජා.මෝ.ම වැඩහල් තුළ පුහුණුව ලබා දීම.	පුහුණුව ලබන හස්ත කර්මාන්ත ශිල්පීන් / සිසුන් සංඛ්‍යාව	60
		සිසුන් හා ක්ෂේත්‍රයට උනන්දුවක් දන්වන්නන් සඳහා පොදු පහසුකම් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	සේවා ලබන සිසුන් හා උනන්දුවක් දක්වන්නන් සංඛ්‍යාව	600
		පුස්තකාල පහසුකම් ඉහළ නැංවීම - ගෘහ අලංකරණ පොත් රාක්ක, මේස හා පුටු මිලදී ගැනීම.	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	50
		හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ දැනුම හා හැකියාවන් ඉහළ නැංවීම සඳහා අදාළ පොත් හා සහරා පුස්තකාලය වෙත ලබා දීම.		235

ව්‍යාපෘතිය	වෙන් කළ මුදල	ක්‍රියාකාරකම්	නිර්නායක	වාර්ෂික ඉලක්ක
නව හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර හඳුන්වා දීම.	10.150	අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම	නව ස්ථාපිත වැඩහල හරහා සංවර්ධනය කරන නව සාම්පල	235
		වැඩහල් පරිශ්‍රය අලුත්වැඩියාව	වැඩහල තුළ පුහුණුව ලබාදීම ප්‍රතිලාභීන් සංඛ්‍යාව	365
පර්යේෂණය හා සංවර්ධනය - නව්‍ය නිෂ්පාදන ක්‍රියාවලින් හඳුන්වා දීම.	2.035	දත්ත මූලාශ්‍රය සකස් කිරීම සඳහා සමීක්ෂණයක් සිදු කිරීම.	නිම කිරීමේ ප්‍රතිශතය	100%
		සුළු හා මධ්‍ය පරිමාණ දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා වර්ථමාන අවශ්‍යතාවය මත පාරම්පරික චිත්‍රකලා හා ප්‍රතිමා කලාව තුළ ඇති සැළසුම් මූලාංග (මෝස්තර / රටා) විධිමත්ව ප්‍රතිනිර්මාණය කර නැවත සමාජගත කිරීම.	ප්‍රලේඛන සංඛ්‍යාව	01
		ශිල්පීය අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම හා තත්වය සහතික කිරීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය	නිම කිරීමේ ප්‍රතිශතය	25%
		පර්යේෂණාගාරය සඳහා සාමාන්‍ය රසායනාගාර උපකරණ මිලදී ගැනීම	නිම කිරීමේ ප්‍රතිශතය	33%
		ශිල්පීන් සඳහා ආරක්ෂිත ලෙස රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	01
		හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ආරක්ෂිත රසායනික ඩයි වර්ග පිළිබඳ පර්යේෂණය	නිම කිරීමේ ප්‍රතිශතය	90%
නිෂ්පාදන ශිල්ප ක්‍රම , නව යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හා උපකරණ, විකල්ප අමුද්‍රව්‍ය හා හඳුන්වා දීම.	0.900	ලාක්ෂා අංශය සඳහා නව යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම	නව යන්ත්‍ර සූත්‍ර සංඛ්‍යාව	02
		ලාක්ෂා සඳහා අමුද්‍රව්‍ය නව්‍යකරණය	නව අමුද්‍රව්‍ය සංඛ්‍යාව	01
		හණ අංශය සඳහා නව යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම	නව යන්ත්‍ර සූත්‍ර සංඛ්‍යාව	01

		හණ සඳහා අමුද්‍රව්‍ය නව්‍යකරණය	නව අමුද්‍රව්‍ය සංඛ්‍යාව	01
දේශීය වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් සහ නව නිර්මාණ ප්‍රදර්ශණ පැවැත්වීම	15.500	අලෙවි පර්යේෂණ වැඩසටහන් සංවිධානය කිරීම	වැඩසටහන් සංඛ්‍යාව	04
		වෙළඳපොළට ගැලපෙන නිර්මාණ හඳුන්වා දීම	අලෙවි පර්යේෂණ වැඩසටහන් හරහා වෙළඳපොළට හඳුන්වාදෙන නව නිර්මාණ සංඛ්‍යාව	60
		වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම	ශිල්පීන්ට ඇති කරන වෙළඳපොළ සම්බන්ධතා සංඛ්‍යාව	20
		අනෙකුත් ආයතන සංවිධානය කරන ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය	ප්‍රදර්ශන සංඛ්‍යාව	06
		ශිල්පීන් හරහා නව නිර්මාණ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන	ශිල්පීන් හරහා නව නිර්මාණ නිෂ්පාදන සංවර්ධනය කරන ප්‍රමාණය	325
		ප්‍රදර්ශණ හා විලාසිතා සංදර්ශන පැවැත්වීම	ප්‍රදර්ශන හා විලාසිතා සංදර්ශන සංඛ්‍යාව	01
			ප්‍රදර්ශන හරහා හඳුන්වාදෙන වෙළඳපොළට ගැලපෙන නව නිර්මාණ සංඛ්‍යාව	350
		ශිල්පීන් සඳහා වෙළඳපොළ සම්බන්ධතා පහසුකම්	ප්‍රදර්ශන හා අලෙවි කවුළු හරහා ආදායම (රු.මි)	2000
මෝස්තර උපදේශන සේවා	බාහිර ප්‍රතිපාදන	තේමා ව්‍යූහයන් , කුසලාන, පදක්කම් හා සමරු පලක සහ වෙළඳ හා ප්‍රදර්ශන කුටි ආදී, (දායකත්වය දරන්නන්ගේ හා වෙනත් සංවිධාන වල ඉල්ලීම පරිදි)	සපයන මෝස්තර උපදේශන සේවා සංඛ්‍යාව	05
			මෝස්තර උපදේශන සේවා හරහා ලබා ගන්නා ලාභය (රු.මි)	1.000
			සැලසුම් කරන ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර නව නිර්මාණ සංඛ්‍යාව	60
තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය අංශය පිහිටුවීම	1.450	අවශ්‍යතාවය මත අදාළ කාර්යයන් සිදු කිරීම	අවශ්‍යතාවය මත අදාළ කාර්යයන් සිදු කිරීම	--
